www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

# Royal College - Colombo 07

## රාජකීය විද්‍යාලය - කොළඹ 07

**Grade 7 - First Term Test - April 2019**

**පළමු වාර පරීක්ෂණය - -2019 අප්‍රේල් - 7 ශ්‍රේණිය**

කාලය - පැය 02
Time - 2 hours

## Sinhala - I

## සිංහල - I

Name : ............................................................ Grade : ........................ Index Number : ..........................

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ''කිඹුල් කඳුළු හෙළීම'' හා ''නිකිණි සෙවීම'' යනු,
   (i) ප්‍රස්තාව පිරුළක් සහ ඉඟිවැකියකි.
   (ii) ඉඟි වැකි දෙකකි.
   (iii) විශාල ලෙස දුක් වීම සහ ඉතා පහසු කටයුත්තක් කිරීම යන අදහස් සහිතය.
   (iv) දුක් සහිත බව පෙන්වීම සහ පහසු කටයුත්තක් කිරීම යන අරුත් සහිතය.

(02) ''පේශල'' යන්නෙහි අදහස,
   (i) ''පේසා වළලු'' යන්නය
   (ii) ''දරුණු'' යන්නය
   (iii) ''දක්ෂ'' යන්නය
   (iv) ''හික්මුණු'' යන්නය

(03) ''ගණින්නාන්සේලා'' යනු,
   (i) සිල්වත් වැලිවිට සමාගමේ භික්ෂූන්ය.
   (ii) ගණන් කරන කණ්ඩායමකි.
   (iii) භික්ෂූන්වහන්සේලාගේ මෙහෙවර භාරගත් පිරිසකි.
   (iv) ඉතා සිල්වත් පිණ්ඩපාතික භික්ෂූන්ය.

(04) සිදත් සඟරා හෝඩියේ ස්වර අක්ෂර ගණන,
   (i) පහකි   (ii) දහයකි   (iii) දහ අටකි   (iv) විස්සකි

(05) ''හෙළ'' යන්නට පර්යාය පද (සමාන පද) වශයෙන්,
   (i) ''සිංහල'' සහ ''සුදු'' යන පද දැක්විය හැකිය
   (ii) ''සිංහල'' සහ ''සිංහ'' යන පද දැක්විය හැකිය
   (iii) ''සිංහල'' සහ ''භාෂාව'' යන පද දැක්විය හැකිය
   (iv) ''සිංහල'' සහ ''රත්‍රන්'' යන පද දැක්විය හැකිය

(06) ''ශ්‍රවන'', ''රුවල'', ''ද්‍රව්‍ය'', ''ගුණ'' යන වචන වල යෙදී ඇති පිල්ලම් පිළිවෙලින්,
   (i) පාපිල්ල, රකාරාංශය, පාපිල්ල, රකාරාංශය සහ යංශය
   (ii) රකාරාංශය, පාපිල්ල, පාපිල්ල, යංශය සහ පාපිල්ල
   (iii) රකාරාංශය, පාපිල්ල, රකාරාංශය, යංශය හා පාපිල්ලය



agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

(07) නිවැරදි අදහස තෝරන්න.

(i) ''කණ්නාඩි'' යන්න නිවැරදි වන අතර ''කන්නාඩි'' යන්න වැරදිය.

(ii) හදවත, සිත, හෘදය, යන අදහසට අනුකූල පද මූර්ධජ ''ළ'' අක්ෂරයෙන් ලියවේ.

(iii) මූර්ධජ 'ෂ' අක්ෂරය සහ තාලුජ 'ශ' අක්ෂරය එක ළඟ යෙදෙන විට මුලින් යෙදෙන්නේ මූර්ධජ 'ෂ' අක්ෂරයයි.

(iv) අතීතකාල ක්‍රියා රූප වල යෙදෙන්නේ දන්තජ ''න'' අක්ෂරයයි.

(08) නිවැරදි අක්ෂර සහිත වාක්‍යය තෝරන්න.

(i) දොඹ මලින් පරිසරය සුවඳවත් වේ.

(ii) රබ ගසෙහි ලේනකු නඳ දෙයි.

(iii) සිව් සගරා වත් බුදු දහමෙහි ඉගැන්වේ.

(iv) දරුවා සිහිනෙන් සුරගන රැගුම් දුටුවේය.

(09) වැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය තෝරන්න.

(i) කොට්ඨාස (ii) ආස්වාද (iii) ආභාශ (iv) නිශ්ශබ්ද

(10) අවසාන ක්‍රියා යනු,

(i) මිශ්‍ර ක්‍රියා ය (ii) ආඛ්‍යාතය ය (iii) පූර්වක්‍රියාව ය (iv) සියලු ක්‍රියා පද ය

(11) ''පනිමින්'', ''නෙළා'', ''බලති'' යන ක්‍රියා රූප තුන පිළිවෙළින් ,

(i) පූර්ව ක්‍රියාවක්, මිශ්‍ර ක්‍රියාවක් සහ අවසාන ක්‍රියාවකි

(ii) අවසාන ක්‍රියාවක්, මිශ්‍ර ක්‍රියාවක් සහ පූර්ව ක්‍රියාවකි

(iii) මිශ්‍ර ක්‍රියාවක්, අවසාන ක්‍රියාවක් හා පූර්ව ක්‍රියාවකි

(iv) මිශ්‍ර ක්‍රියාවක්, පූර්ව ක්‍රියාවක්, හා අවසාන ක්‍රියාවකි

(12) පහත පිළිතුරු අතරින් මහාප්‍රාණ අක්ෂරයක් ඇතුළත් වරණය වන්නේ,

(i) ණ, ළ, ශ, ඓ (ii) ඨ, ළ, ෂ, ත

(iii) එ, ඵ, ෂ, ට (iv) එ, ශ, ෆ, ඍ

(13) නිවැරදි පිළිතුර තෝරන්න.

(i) කෙණෙර යනු කවුඩාගේ ස්ත්‍රී ලිංග පදයයි.

(ii) අශ්වයා යන්නෙහි ස්ත්‍රී ලිංග පදය අශ්ව ධේනුවයි.

(iii) ''වස්සා'' යන්නෙහි ස්ත්‍රී ලිංග පදය ''ගොනා'' යන්නය.

(iv) කෙණෙර යනු අලියා ගේ ස්ත්‍රී ලිංග පදයයි.

(14) කළෙහි, කළෙහු, කරමි යන ආඛ්‍යාත පද පිළිවෙළින්,

(i) උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ හා ප්‍රථම පුරුෂ වේ.

(ii) මධ්‍යම පුරුෂ, මධ්‍යම පුරුෂ හා උත්තම පුරුෂ වේ.

(iii) උත්තම පුරුෂ, ප්‍රථම පුරුෂ හා මධ්‍යම පුරුෂ වේ.

(iv) මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ, හා උත්තම පුරුෂ වේ.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

(15) "පඬිදෙකි වියත් බුදු සව්වන් ඇසුරු කළ
තවුසෙකි සිසිල් ගුණයෙන් හද සුවඳ කළ"
මෙම කවියෙහි පඬිදා හා තවුසා ලෙස නම් කර ඇත්තේ,
(i) මහගමසේකර මහතා ය
(ii) ගරු ම'සලින් ජයකොඩි පියතුමා ය
(iii) රදගුරු එඩ්වන්ඩ් පීරිස් හිමියන් ය
(iv) මාර්ටින් වික්‍රමසිංහ මහතා ය

(16) හරි පුදුම ඉස්කෝලෙ, අක්කර පහ, මාවතේ ගීතය, රෝහිණී යන පොත් නාමාවලිය අනුව කතුවරුන්ගේ නාම අනුපිළිවෙළ වන්නේ,
(i) චින්තා ලක්ෂ්මී සිංහ ආරච්චි, මඩවල එස් රත්නායක, ටී.බී. ඉලංගරත්න, මාර්ටින් වික්‍රමසිංහ යන්නය
(ii) ටෙට්සුකෝ කුරයොනගී , මඩවල එස්. රත්නායක, චින්තා ලක්ෂ්මී සිංහ ආරච්චි, මාර්ටින් වික්‍රමසිංහ යන්නය.
(iii) ටී.බී. ඉලංගරත්න, මාර්ටින් වික්‍රමසිංහ, කුමාරතුංග මුණිදාස, ජී.බී. සේනානායක යන්නය.
(iv) ඉනිඩ් බ්ලයිටන්, මඩවල එස්. රත්නායක, ටී.බී. ඉලංගරත්න, කුමාරතුංග මුණිදාස යන්නය.

(17) "සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය" කෘතිය රචනා කළේ,
(i) මහාචාර්ය ජේ.බී. දිසානායක මහතාය
(ii) මාර්ටින් වික්‍රමසිංහ මහතාය
(iii) මහාචාර්ය සඳගෝමි කෝපරහේවා මහතාය
(iv) මහාචාර්ය සරත් විජේසූරිය මහතාය

(18) උපසර්ග භාවිතයෙන් විරුද්ධ පද සාදාගත් අවස්ථාවකට උදාහරණයක් වන්නේ,
(i) මෛත්‍රී - වෛරී
(ii) සිරිත් - විරිත්
(iii) අභ්‍යන්තර - බාහිර
(iv) ගුණ - අගුණ

(19) නිපාත පදයක් යොදා විරුද්ධ පද සාදාගත් අවස්ථාවකට උදාහරණ වන්නේ
(i) නම්බුව - අවනම්බුව
(ii) අවමාන - සම්මාන
(iii) වෙනස් - නොවෙනස්
(iv) ඇති - නැති

(20) සිංහල භාෂාවට සුවිශේෂී වූ, වෙනත් භාෂාවක දැකිය නොහැකි අක්ෂර වර්ගයකි.
(i) මූර්ධජ
(ii) ඌෂ්මාක්ෂර
(iii) සඤ්ඤක
(iv) මහාප්‍රාණ

(ලකුණු 2 x 20 = 40)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

## II කොටස

**1 හා 2 ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු ලියන්න.**

(01) කමතේදී භාවිතා වන විශේෂ යෙදුම් පිළිබඳව ඔබ සාදන ලද බිත්ති පුවත්පතෙහි,

1. කියවන්නන් ආකර්ශනය කරගැනීම සඳහා යෙදූ උපක්‍රමයක් ලියන්න. (ල. 1)
2. බිත්ති පුවත්පත සඳහා කරුණු සොයාගත් මූලාශ්‍ර දෙකක් ලියන්න. (ල. 2)
3. බිත්ති පුවත්පත සකස්කිරීමේදී ඇතිවූ ගැටලු 2 ක් ලියන්න. (ල. 2)
4. ඒ සඳහා ඔබ යෙදූ විසඳුම් 02 ක් ලියන්න. (ල. 2)
5. ලිපිය සකස් කිරීමේදී ඔබ කමත පිළිබඳව දැනගත් නව තොරතුරු 02 ක් ලියන්න. (ල.2)
6. කෘෂිකාර්මික ජීවන රටාව තුළ දක්නට ලැබුණු වැදගත් සාරධර්ම තුනක් ලියන්න. (ල. 3)
7. ඔබ දන්නා කමත් කවියක් ලියන්න. (ල. 4)

(ලකුණු 16)

(02) දී ඇති රචනා මාතෘකා අතරින් එකක් තෝරාගෙන රචනයක් ලියන්න.
(වචන 150ට නොඅඩු)

1. අපේ ගමට ආ අභිකුණ්ඨික අමුත්තෝ
2. ගොයම් කයිය දා ගමට ගියෙමි
3. සුහද කතාවයි මතු ගුණ සුවඳයි
4. දෙව් දම් ඇදුරු එඩ්මන් පීරිස් අගරදගුරු හිමි
5. සරණංකර සංඝරාජ හිමිපාණෝ

(ලකුණු 14)

(03) සුදුසු උක්ත පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(i)

1. .................................. සුවඳ මලින් බුදුන් පුදති
2. .................................. සතුටු සිතින් පාසල් ගියෙමු.
3. .................................. කුඹුරු වැඩ කළෙහු.
4. .................................. උදෑසන අවදි වන්නෙහි.
5. .................................. ගොයම් කොළය මැඩවූහ.

(ල. 5)

(ii) පහත සඳහන් පුරුෂ ලිංග නාම පදවල ස්ත්‍රී ලිංග පදය ලියන්න.

1. සිංහයා -- ..................................
2. කුමරා -- ..................................
3. අශ්වයා -- ..................................
4. මොනරා -- ..................................
5. මත්ස්‍යයා -- ..................................

(ල. 5)
(මුළු ලකුණු 10)

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk


සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

(04) පහත ක්‍රියා මූලයන්ට අදාල මිශ්‍ර ක්‍රියාව සහ පූර්ව ක්‍රියාව ලියන්න.

| ක්‍රියා මූලය | මිශ්‍ර ක්‍රියාව | පූර්ව ක්‍රියාව |
|---|---|---|
| 1. නට | ........................................ | ........................................ |
| 2. සිත | ........................................ | ........................................ |
| 3. බල | ........................................ | ........................................ |
| 4. කප | ........................................ | ........................................ |
| 5. දුව | ........................................ | ........................................ |

(ල. 10)

(05) ප්‍රහේලිකාව පුරවන්න.




(ල. 10)

<u>හරහට</u>

1. ගාඩි බසින් ''මස්කත්'' යයි ව්‍යවහාර වේ.
2. අභිකුණ්ඨිකයෝ මෙයට ''රෝලු'' යයි කියති.
3. කමත් බසෙහි කළගෙඩියට මෙසේ ව්‍යවහාර කෙරෙයි.
4. ''උදව්වට වැඩ කර දීම'' මේ වචනයේ අර්ථයයි.
5. ''කළය'' යන්නට අභිකුණ්ඨික ව්‍යවහාරයයි.
6. රතු ගඟුල සමඟ මේවා භාවිත කෙරේ.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

පහලට

1. ''සුදු රෙදි කඩ' යන්න සඳහා යෙදෙන ව්‍යවහාරයයි.
2. කමතේදී ගන්නා උදෑසන ආහාරවේලයි.
3. මුල්ම මැඩුවන් හලා බැමයි.
4. ගොත් කණුවේ සිට අවසානයට ඇඳුත්තේ බැඳ සිටින ගවයා මේනමින් හඳුන්වයි.

(06) පහත කවි සම්පූර්ණ කරන්න.

I. .................................................................................................

.................................................................................................

.................................................................................................

බල සුබ නිමිති පෙර මග නැකතටත් වැඩී

agaram.lk

II. .................................................................................................

පුල් එරහැඳි හෝ පලු මී අඹ පළොලී

.................................................................................................

නිල් ගන සා සෙවනළු දෙතෙර මනකලී

(ල. 10)



agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Right Reserved

(07) සාමණේර අවදියේ සිටම උන්වහන්සේ වෙත දැඩි ශාස්ත්‍ර පිපාසයක් දක්නට ලැබුණි. උන්වහන්සේ ගුරුවරුන් සොයා ගමක් ගමක් පාසා යන්නට වූහ. බාලාවතාරය නම් වූ පාලි ව්‍යාකරණ පොතේ මුල් කොටස උන්වහන්සේ උගත්තේ එකල සිරගත ව සිටි මාකෙහෙල්වල ලෙව්කේ රාල නම් ගුරුවරයෙකුගෙනි. එහි ඉතිරි කොටස පල්කුඹුරේ අත්ථදස්සී හිමියන්ගෙන් උගත්හ. එතැන් සිට උන්වහන්සේ නිරන්තයෙන්ම ශාස්ත්‍රෝද්ග්‍රහණයේ නියැළුණහ.

1. පහත වචනවලට සමාන වචන ඡේදයෙන් උපුටා ලියන්න.
   (i) ඉගෙනීමේ දැඩි කැමැත්ත -
   (ii) ශිල්ප ඉගෙනීම

2. ඡේදයේ දැක්වෙන පාලි භාෂාව උගැන්වීමට යොදාගන්නා ග්‍රන්ථය කුමක්ද?

3. 'හිත ඇත්නම් පත කුඩාද?' යන ප්‍රස්තාව පිරුළට ගැළපෙන මෙහි සඳහන් සිදුවීම කුමක්ද?

4. මාකෙහෙල්වල ලෙව්කේ රාල සහ පල්කුඹුරේ අත්ථදස්සී හිමි කවර විෂයයක නිපුණයන් වන්නට ඇත්ද?

5. "නියැළුණහ" යන වචනය යොදා වාක්‍යයක් සාදන්න.

(2 x 5 = 10)

(08) පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
1. ජන කතා යනු මොනවාදැයි කෙටියෙන් හඳුන්වන්න.
2. ජන කතාවල ඇතුළත් භාෂාවේ ඇති යෙදුම් වර්ග 02 ක් ලියන්න.
3. ඉන් එක් යෙදුම් වර්ගයක් සඳහා උදාහරණ 02 ක් ලියන්න.
4. ජන කවි හා ජන කතාවල සමානතා 02 ක් ලියන්න.
5. ජන කවි හා ජන කතා කියවීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න.

(2 x 5 = 10)

(ලකුණු 60)

(මුළු ලකුණු 100)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk